# රුසියාවෙන් කතා ගෙනා ඇදිගම රුද්‍රිගු මාමා




" මල් පෙත්තේ මල් පෙත්තේ

උතුරු දෙසට දකුණු දෙසට

බටහිරටත් නැගෙනහිරට

ඉගිළ ඉගිළ මෙහැම දෙසට

කැරකීලා ඇවිත් බිමට

මකියන දෙය කරදෙන් මට"

රෂිනි මේ පද පේළිය මුමුණද්දී එයාගේ අක්කා ආශිනී එතැනට ආවා.
“හොඳයි කියන්න බලන්න ඔය කවිය තියෙන පොත මොකක්ද කියලා”
ආශිනී රෂිනිගෙන් ඇසුවා.

“මං ආසම ආසා හත්පෙතිමල පොතේනේ”

“හරියට හරි ” ආශිනී කිව්වා.

“අක්කෙ ඔයා ආසම රුසියානු ළමා කතාව මොකක්ද?”
රෂිනි එයාගේ අක්කා ආශිනීගෙන් ඇසුවා.

” මං නම් ආසම නිකීතාගේ ළමා කාලය පොත”

“මං නම් වෙන කිසිම රුසියන් කතා පොතකට වැඩිය ආසම ආසම හත්පෙති මල පොත”

“හත්පෙති මල පොතට මාත් ආසයි. ඔයා දන්නවද ඒ පොත සිංහල භාෂාවට පරිවර්තනය කළේ කවුද කියලා?”

“නෑ කවුද?”

“ඒ තමයි දැදිගම වී. රුද්‍රිගු කියන මාමා”

“එතකොට නිකීතාගේ ළමාකාලය ?”

“ඒකත් පරිවර්තනය කරලා තියෙන්නේ රුද්‍රිගු මාමා තමයි”




“එතකොට වැඩ බැරි දාසගේ කතා?”

“ඒවත් රුද්‍රිගු මාමා තමයි පළමුවරට පරිවර්තනය කරලා තියෙන්නේ”

“වීර කුහුඹුවා ? එතකොට සුදු මුවා? රතු කරමලා?”

“ඒකත් මේ මාමම තමයි”

“මොනවා? ඒ ඔක්කොම රුසියානු ළමාකතා ඒ මාමා ද පරිවර්තනය කරලා තියෙන්නේ?” රෂිනි ඇස් ලොකු කරගෙන පුදුමයෙන් ඇසුවා.

“ඔව් නංගි එයා තමයි රුසියානු ළමා සාහිත්‍ය ලංකාවට හඳුන්වලා දීලා තියෙන්නේ. ළමා සාහිත්‍ය කෘති විතරක් නෙවෙයි සෝවියට් රුසියානු නවකතා සහ කෙටිකතා ගොඩකුත් රුද්‍රිගු මාමා සිංහල භාෂාවට හරිම ලස්සනට පරිවර්තනය කරලා තියෙනවා”

” මට ආසයි ඒ මාමා ගැන තොරතුරු ටිකක් දැනගන්න”

“ආ මං දැක්කා අද මිහිර පත්තරේ ඒ ගැන තොරතුරු තියෙනවා.
එන්න අපි ඒක කියවමු”

## ජීවන තොරතුරු

* උපන්දිනය – 1929 ජූනි 25

* උපන් ස්ථානය – මීගමුව

* සම්පූර්ණ නම – දොන් වින්සන්ට් රුද්‍රිගු

* ලේඛන කලාවේදී භාවිතවන නාමය – ඇදිගම වී. රුද්‍රිගු

* ඉගෙනුම ලැබූ පාසල් – ගමේ පාසලේ ප්‍රාථමික අධ්‍යාපනය සහ ද්විතීයික අධ්‍යාපනය

* අධ්‍යාපනය – කොටහේන ශාන්ත බෙනඩික් විද්‍යාලය

1957- ලෝක තරුණ උලෙළට සහභාගි වීම සඳහා රුසියාවට යෑම

1960 – රුසියාවේ මොස්කව් නුවර ජනතා මිත්‍රත්ව සරසවියට (ලුමුම්බා විශ්වවිද්‍යාලය) ඇතුළත් වී වෛද්‍ය උපාධිය හැදෑරීම

* වෘත්තිය – වෛද්‍ය වෘත්තිය/පරිවර්තක

* බිරිය – යුක්රේනයේ කිව් නගරයේ විසූ මිලිටරි ගුවන්යානා සැලසුම් ශිල්පිනියක වන ලුද්මිලා මෝර්ව්කොව්නා විෂ්නපෝල්ස්කයා

* දරුවන් – වැඩිමහල් පුතු – වික්තර් දෙවැනි පුතු – දිමිත්‍රි

70 දශකයේදී රුසියාවේ සේවය කරමින් එරට ස්ථිරව පදිංචිව සිටියදී වෘත්තීය පරිවර්තකයකු වශයෙන් සෝවියට් රුසියානු ග්‍රන්ථ සිංහල භාෂාවට පරිවර්තනය කිරීම ඇරඹීම

* අභාවය – 1988 නොවැම්බර් 27

* ලැබූ සම්මාන – ලියෝ තොල්ස්තෝයි සම්මානය -2005

## එතුමා පරිවර්තනය කළ ග්‍රන්ථ

ඔහු විවිධ ග්‍රන්ථ 200කට අධික සංඛ්‍යාවක් පරිවර්තනයකර තිබේ.

ළමා කතා, සුරංගනා කතා සහ ජන කතා, යොවුන් කතා, නවකතා, කෙටිකතා වෙනත් විෂයයන් (දේශපාලන, විද්‍යාව, ගණිතය, ඉංජිනේරු විද්‍යාව) ආදී වශයෙන් එම පොත් වර්ග කළ හැකියි.

## ළමා කතා

හත්පෙතිමල – වලෙන්තීන් කතායෙව්

මාෂා සහ වලසා

පුංචි සත්තු – ඇලෙක්සේයි ලාප්තියෙව්

කම්මැළියාට ලියුමක් – වයි.අකීම්

වීර කුහුඹියා – තත්යානා මකාරවා

පණ ඇති තොප්පිය – නිකොලායි නෝසොව්

ළපයා හපනා

වී කරල – යුක්රේනියානු ජනකතාවක්

රතු කරමලා – රුසියානු ජනකතාවක්

යූෂ්කා – අලෙක්සන්දර් කුප්රින්

රසකතා – රුසියන් ගත්කරුවන්ගේ ළමා කතා එකතුවකි

ඇත් පැටවා – ගෙනාදි සිපරෙව්

වැඩ බැරි දාස ගැන කතා – නිකොලයි නෝසොව්

නිල් පාට කොළ – වී. ඒ. ඔසීයෙවා

රත්තරන් යතුර හෙවත් බුරතිනෝගේ හපන්කම්-අලෙක්සේයි තොල්ස්තෝයි

මී හාමී දියට ගියා – ළමා කවි

නිල් කබාය සහ මායාකාර රජ- බෙලොරුසියානු ජනකතාවක්

සුදු මුවා – ලැට්වියානු ජනකතාවක්

ළමයින්ට ඉර හඳ තාරකා ගැන කතා – යෙප්රෙම් ලෙවිතාන්

සීයාගේ ඇස් කණ්ණාඩි-ගියෝර්ගි යුර්මින්

ලස්සන මාළුවෝ – වික්ටර් දට්ස්කේවිච්

දේදුන්නෙන් සෙවණ ලබන වන පොව්වෝ -නිකොලායි ස්ලද්කොව්

පින්තූර කතා – එන්. රැඩ්ලොව්

ගල් වඩුවා

වලසුන් තුන්දෙනා – ලෙව් තොල්ස්තෝයි උපමා කතා

මිනිසා ගුවන්ගත වෙයි – කාල් අරොන්

ටෙලිෆෝනය

ලෙව් තොල්ස්තෝයි ළමා කතා

සිංහයා සහ බලු පැටියා

ලී බෝනික්කා සහ යකින්න

යුසිකේගේ මිතුරන් සත්දෙනා – සිල්වි වලායාල්

තැග්ග-වී. සුතෙයෙව්

වීර යට්ටෝගේ සහ තෙයුන්ගේ කතන්දරය – උතුරු රුසියාවේ නෙන්ට්ස් ජනකතාවක්

## යොවුන් කතා

මගේ හපන්කම් – ගපූර් ගුල්යාම්

නිකීතාගේ ළමා කාලය – අලෙක්සේයි තොල්ස්තෝයි

ලස්සන වසිලීස්සා

නපුරු පාලකයෝ තුන්දෙනා – යූරී ඔලේෂා

වැලි සෙල්ලම

## නවකතා

ගුරු ගීතය – චිංගීස් අයිත්මාතොව්

අම්මා – මක්සිම් ගෝර්කි

වානේ පන්නරය ලැබූ සැටි – නිකලොායි ඔස්ත්‍රොව්ස්කි

ජමීලා – චිංගීස් අයිත්මාතොව්

අම්මා සහ මිහිකත – චිංගීස් අයිත්මාතොව්

අනර්හායිහි සුන්දර කත – චිංගීස් අයිත්මාතොව්

සුන්දර නතාෂා – මක්සිම් ගෝර්කි

රතු රුවල් – අලෙක්සැන්දර් ග්‍රීන්

අපරාදදඩය හා දඬුවම -ජ්යෝදෝර් දොස්තයෙව්ස්කි

සුදු අන්තුවා -ප්යෝදෝර් දොස්තයෙව්ස්කි

බෙල්කින්ගේ කතා – ඇලෙක්සැන්ඩර් පුෂ්කින්

කපිතන්ගේ දියණියෝ – ඇලෙක්සැන්ඩර් පුෂ්කින්

මක්සිම් ගෝර්කි චරිතාපදාන ත්‍රිත්වය

(ළමා විය, මිනිසුන් අතර, මගේ සරසවි)

සැබෑ මිනිසකුගේ කතාවක් – බරිස් පලෙවොයි

අපේ කාලයේ වීරයෙක් – මිහායිල් ලෙර්මන්තොව්

නැති වුණ වස්තුව

අඳ වාදකයා – වී.කරලෙන්කො

දුබ්රොව්ස්කි – ඇලෙක්සැන්ඩර් පුෂ්කින්

ඉස්කෝප්ප රැජණ – ඇලෙක්සැන්ඩර් පුෂ්කින්

උණු හිම – යූරී බොන්දරෙව්

තුන් අවුරුද්ද – ඇන්ටන් චෙකෝව්

## කෙටිකතා

සෝවියට් රුසියන් කෙටිකතා කලඹ I, II, III

හතළිස් එක් වැන්නා-මක්සිම් ගේර්කි

ඇන්ටන් චෙකොව්ගේ කෙටිකතා

චින්ගීස් අයිත්මාතව් කෙටිකතා

මක්සිම් ගෝර්කිගේ කෙටිකතා

නිකොලායි ගොගොල් තෝරා ගත් කෙටිකතා

නාසය, සිත්තම

ප්යෝදර් දොස්තයෙව්ස්කි තෝරාගත් කෘති

ඇලෙක්සන්දර් පුෂ්කින් තෝරාගත් කෘති

දොන් පෙදෙසේ කතා- මිහයිල් ෂෝලහව්

විද්‍යා සහ ගණිත ග්‍රන්ථ

දයලෙක්තික භෞතික විද්‍යාව

නදේෂ්ඩා නඩේජනාගේ උද්භිද විද්‍යාව පිළිබඳ තොරතුරු කෘතිය

එම්. නෙස්තූර්ග් ගේ මිනිසාගේ සම්භවය

හැමට හොරෙන් ලෝකෙ වටේ—නිකොලයි ඔසිපව්

අරුම පුදුම ගස්

අසිරිමත් කෘමි සත්තු

ගණිත විනෝදය- වයි.පෙරෙල්මාන්

ගණිත හෝඩිය

භෞතික විද්‍යා විනෝදය

ඉංජිනේරුවකු වීමට ඔබත් කැමැතිද?

ග්‍රහලෝකයක විනාශය- සෝවියට් විද්‍යා ප්‍රබන්ධ

## දේශපාලන ග්‍රන්ථ

මාක්ස් සහ එංගල්ස් ගැන ස්මෘති සටහන්, ලෙනින්

මාක්ස් සහ එංගල්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශනය, වී. ජී. අපනාසියෙව්ගේ මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම

## රුද්‍රිගු මාමාගේ පරිවර්තන

එකල සෝවියට් සමූහාණ්ඩුවට රටවල් 15ක් අයත් වී තිබිණි. රුසියාව, යුක්රේනය, බෙලාරුසියාව, උස්බෙකිස්ථානය, කසකස්ථානය, ජෝර්ජියාව, අසර්බයිජානය, ලිතුවේනියාව, මෝල්දාවියාව, ලැට්වියාව, කිර්ගිස්ථානය, ටජිකිස්ථානය, ආර්මේනියාව, තුර්ක්මේනිස්ථානය සහ එස්තෝනියාව එම රටවල් 15යි. මේ නිසා එකල රුසියානු සාහිත්‍යයට මේ රටවල් 15ටම අයත් ජනකතා, සුරංගනා කතා ඇතුළත් වූ අතර, එම රටවල් 15ටම අයත් ලේඛකයන්ගේ ලියූ කෘති ද රුසියානු සාහිත්‍යයට ඇතුළත් විය. මේ සෑම සෝවියට් රටකටම අයත් සාහිත්‍යය කෘති රුද්‍රිගු මාමා සිංහල භාෂාවට පරිවර්තනයකර තිබේ.

ඔහු පරිවර්තනය කළ අගනාම කෘති කිහිපයක්

ඔහුගේ පරිවර්තනය කෘති අතර වඩාත්ම වැදගත් කෘති ලෙස සැළකෙන්නේ අම්මා , ගුරු ගීතය , වානේ පන්නරය ලැබූ සැටි කෘති සහ හත්පෙතිමල සහ ලස්සන වසිලීස්සා යන ළමා කතන්දර පොත් ය.

## අම්මා

මක්සිම් ගෝර්කිගේ ප්‍රකටම නවකතාවක් ලෙස සැළකෙන අම්මා කෘතිය සෝවියට් රුසියාවේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයග්‍රහණය සඳහා බෙහෙවින් බලපා තිබේ. විප්ලව සමයේ අරගලවල යෙදෙන පාවෙල් නමැති නිර්භීත කම්කරු තරුණයාට අසාධාරණයට එරෙහිව සටන් වැදීමට සහාය වන ඔහුව නිතරම දිරිගන්වන එඩිතර මවකගේ චරිතය මෙහි ඉස්මතු වී පෙනෙයි.

## වානේ පන්නරය ලැබූ සැටි

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි විසින් රචනා කරන ලද මෙම කෘතියෙහි ද පාවෙල් කෝර්චාගින් නමැති කම්කරු තරුණයා ධනපතිවාදයට එරෙහිව අරගල කර ජය ගන්නා ආකාරය දැක් වේ.

## ගුරු ගීතය

ඔහු විසින් අනුවර්තනය කරන ලද රුසියානු ලේඛක කිර්ගිස්ථාන් ලේඛක චිංගීස් අයිත්මාතොව්ගේ දුයිෂේන් හෙවත් පළමු ගුරුවරයා
ගුරු ගීතය එදා මෙදාතුර සිංහල පාඨකයන් අතර නොමඳ ගෞරවාදරයට පාත්‍ර වි තිබෙයි. දුයිෂෙන් නම් ගුරුවරයා අල්තිනායි නමැති දුප්පත් දැරියට ජීවිතය මෙන්ම සිප් සතර ද කියා දී ඇයට යහපත් අනාගතයකට මඟ පෑදූ ආකාරය මෙහි දැක් වේ.

"ඔව්, ශීත කාලය පැමිණේවි. තද ශීත කුණාටු හමාවි. හිම කැට සහිත මහ නපුරු සුළි සුළං හමාවි. එහෙත් වසන්තය එනවා සත්තයි"
ගුරු ගීතයේ අඩංගු මෙම වාක්‍ය කිසිදා අමතක නොවෙයි.

## හත්පෙතිමල

වලෙන්තීන් කතායෙව්ගේ රුසියානු ළමා කතාවක් ඇසුරෙන් රුද්‍රිගු මාමා අනුවර්තනය කරන ලද අපූරු ළමා කතාවකි මෙය. ශේන්යා නමැති දැරිය පාන් වළලු ගෙන එන්නට ගොස් එමින් සිටියදී ඇයට හමුවන මායාකාරියක විසින් දෙනු ලබන පාට හතක් සහිත මායාකාර මලෙහි පෙති හත කඩා විවිධ දේ ලබා ගන්නා ආකාරය මෙම කතන්දරයේ දැක් වේ. නිකරුණේ මල් පෙති හයක් එතරම් ප්‍රයෝජනයක් නොමැති දේවලට වැය කරන ශේන්යා පාදයක ආබාධ සහිත වීත්යා නමැති පිරිමි ළමයා සුව කරගැනීමට අවසන් මල් පෙත්ත භාවිත කිරීම කතාව අවසානයේදී දැක්වේ .

## ලස්සන වසිලීස්සා

රුසියානු සුරංගනා කතා අඩංගු මෙහි බබායිගා මායාකාරියගේ චරිතය ද දැක ගත හැකි ය.
මේ සියලු කතා රුසියානු බසින් ඍජුවම සිංහල භාෂාවට පරිවර්තනයකර තිබීම ද රුද්‍රිගු මාමාගේ දක්ෂතාවක් ලෙස විශේෂයෙන් හැඳින්විය හැකි ය. එමෙන්ම අපට නුපුරුදු රුසියානු සංස්කෘතිය අපට ඉතා සමීප කරවීමට ද රුද්‍රිගු මාමාගේ අගනා පරිවර්තන හැකියාව බෙහෙවින් සමත් වී තිබේ.

රුසියාවේ වාලෙන්කි හිම සපත්තු, සමොවාරය (තේ සෑදීමට ජලය උණු කරන ලෝහ බඳුන), පොප්ලර් ගස් සහ හිම යනාදියත් මාෂා, මීෂා, සාෂා, මීෂ්කා, සාෂෙන්කා, පාවෙල්, පාව්කා, දුයිෂේන්, අල්තීනායි , නතාෂා, ඉවාන්, මර්යූෂ්කා යන නම් ද ශ්‍රී ලාංකික අපට මෙතරම් හුරු කළාට අපි දැදිගම රුද්‍රිගු මාමාට බෙහෙවින් තුති පුදමු.

*හර්ෂණී ගමගේ*